Community Resilience
to Foreign Interference

# ඩොක්සිං

## ඩොක්සිං (doxing හෝ doxxing) යනු කුමක් ද?

ඩොක්සිං යනු යමෙකු ඔබෙන් විමසීමකින් තොරව ඔබේ පුද්ගලික හෝ පෞද්ගලික තොරතුරු අන්තර්ජාලයට ඇතුළත් කිරීමයි මෙයට ඔබේ සම්පූර්ණ නම, නිවසේ ලිපිනය, දුරකථන අංකය, ඔබ සේවය කරන ස්ථානය හෝ ඔබේ පවුලේ සම්බන්ධතා තොරතුරු පවා ඇතුළත් විය හැකි ය. බොහෝ විට ඔවුන් ඔබව භය කිරීමට, තර්ජනය කිරීමට, හිරිහැර කිරීමට හෝ බිය ගැන්වීමට එම තොරතුරු භාවිතා කිරීමට අන් අයව දිරිමත් කරයි.

**ඩොක්සිං කිරීම විදේශීය රාජ්‍යයක් වෙනුවෙන් හෝ ඒ වෙනුවෙන් සිදු කරන්නේ නම්, මෙය විදේශීය මැදිහත්වීමක ආකාරයකි.** පුද්ගලික සහ පෞද්ගලික තොරතුරු ප්‍රසිද්ධියේ බෙදා ගැනීම කෙනෙකුගේ පෞද්ගලිකත්වයට සහ ආරක්ෂාවට හානි කළ හැකි ය.

# ඔබව ඩොක්සිං කරන්නේ නම් කළයුත්තේ කුමක් ද

## ඔබේ පවුලේ අයට සහ මිතුරන්ට පවසන්න

ඔබට ගැටලුවක් නොවන්නේ නම්, ඔබේ පවුලේ අයට සහ මිතුරන්ට සිදු වූ දේ දන්වන්න, ඔවුන් ද ඉලක්ක කර ගත හැකි ය. ඔවුන්ගේ සමාජ මාධ්‍ය ගිණුම් පුද්ගලික ලෙස සැකසීමට පවසන්න.

## එය සිදුවූ වේදිකාව/වෙබ් අඩවිය/ යෙදුම තුළ එය පැමිණිලි කරන්න

එය සිදුවූ වේදිකාව/වෙබ් අඩවිය/ යෙදුම තුළ පැමිණිලි කිරීමේ ක්‍රමවේදය භාවිතා කරන්න. Netsafe's සමාජ මාධ්‍ය මාර්ගෝපදේශවල මෙය කරන්නේ කෙසේද යන්න පිළිබඳ තොරතුරු තිබේ.

## Netsafe වෙත වාර්තා කරන්න

ඔබට Netsafe වෙත හානිදායක අන්තර්ගතයන් පැමිණිලි කළ හැක: ඉල්ලීමක් ලබාදෙන්න – Netsafe. Netsafe ඔබට මාර්ගගත ආරක්ෂාව පිළිබඳ විශේෂඥ සහාය සහ උපදෙස් ලබා

දිය හැකි ය. සහය ලබාගැනීමට help@netsafe.org.nz වෙත ඊමේල් කරන්න හෝ 4282 වෙත 'Netsafe'ලෙස කෙටි පණිවිඩයක් යොමුකරන්න.

## පොලීසියට පැමිණිලි කරන්න

ඔබ අවදානමක සිටින්නේ නම්, 111 ඇමතීමෙන් ක්ෂණිකව පොලීසිය සම්බන්ධ කරගන්න.

හදිසි අවස්ථාවක් නොවේ නම්, ඔබට මෙම ක්‍රමවලින් පොලිසිය ඇමතිය හැක:

- 105 අන්තර්ජාල පෝරමය භාවිතයෙන්
- ඕනෑම ජංගම දුරකථනයකින් හෝ ස්ථාවර දුරකථනයකින් 105 අංකයට ඇමතීමෙන්, මෙම සේවාව නොමිලේ වන අතර රට පුරා 24/7 ලබා ගත හැකි ය.

පොලිසියට ඔබේ පැමිණිල්ල සැකසීමට සහ ඔබ සමඟ පසු විපරම් කිරීමට උපකාර කිරීම සඳහා 105 පෝරමය ඔබේ පුද්ගලික තොරතුරු කිහිපයක් ඉල්ලා සිටී. **පොලිසිය මෙම තොරතුරු භාවිතා කරන්නේ අවසර ලත් අරමුණු සඳහා පමණි.**

## NZSIS වෙත පැමිණිලි කිරීම

ඔබේ ඩොක්සිං කිරීම පිටුපස විදේශීය රාජ්‍යයක් සිටින බවට ඔබ සැක කරන්නේ නම්,ඔබට ඔවුන්ගේ ආරක්ෂිත මාර්ගගත පෝරමය භාවිතයෙන් NZSIS වෙත මෙය පැමිණිලි කළ හැකි ය.

ඔබට අවශ්‍ය නොවේනම් ඔබේ නම,දුරකථන අංකය හෝ සම්බන්ධතා තොරතුරු වැනි ඔබේ පුද්ගලික තොරතුරු ලබා දීමට අවශ්‍ය නැත. ඔබට ඔබේම භාෂාවෙන් පෝරමය පිරවිය හැකි ය. ඔබ සපයන තොරතුරු **රහසිගත හා ආරක්ෂිතව** තබාගනු ඇත.

ඔබට NZSIS හි කෙනෙකු සමඟ කතා කිරීමට අවශ්‍ය නම්, ඔබට +64 4 472 6170 හෝ 0800 747 224 අංකවලින් ඔවුන් ඇමතිය හැක.

### පැමිණිලිකිරීමේ දී Netsafe, පොලිසිය හෝ NZSIS සමඟ බෙදා ගැනීමට තොරතුරු

පැමිණිලිකිරීමේ දී හැකිතාක් තොරතුරු ලබාදීම ප්‍රයෝජනවත් වේ. මේවාගේ තිර පිටපතක් හෝ පිටපතක් ලබාගැනීමට උත්සහ කරන්න:

- බෙදාගත් හෝ පළකරන ලද පුද්ගලික තොරතුරු

- එය බෙදාගත් පුද්ගලයාගේ පරිශීලක පැතිකඩ හෝ ගිණුම (උදා: ඔවුන්ගේ පරිශීලක නාමය)
- තොරතුරු බෙදාගත් හෝ පළ කළ දිනය සහ වේලාව
- එය සිදුවූ වෙබ් අඩවියේ හෝ යෙදුමේ නම

# ඩොක්ස් වීමකින් ඔබව ආරක්ෂා කරගන්නේ කෙසේද

## වැඩිදුර තොරතුරු සඳහා **අන්තර්ජාලයේ ආරක්ෂිතව සිටින්න**

අන්තර්ජාලයේ ආරක්ෂිතව සිටීම බලන්න.

## අන්තර්ජාලය හරහා තොරතුරු බෙදා ගැනීමේ දී ප්‍රවේශම් වන්න

ඔබේ සමාජ මාධ්‍ය සහ සබැඳි ගිණුම්වල රහස්‍යතා සැකසුම් පරීක්ෂා කරන්න. ඔබ විශ්වාස කරන පුද්ගලයින්ට පමණක් ඔබේ තොරතුරු දැකිය හැකි වන පරිදි ඔබේ පැතිකඩ පුද්ගලික ලෙස සකසන්න.

## ඔබ ගැනම වෙබ් සෙවුමක් කරන්න

ඔබ ගැන ප්‍රසිද්ධියේ ලබා ගත හැකි තොරතුරු බැලීමට ඔබේ නම සහ පුද්ගලික තොරතුරු සොයා බලන්න. ඔබට හානියක් කිරීමට භාවිතා කළහැකි, ඔබේ ලිපිනය වැනි පුද්ගලික තොරතුරු ඉවත්කරන්න.

## ඔබගේ උපාංගවල ස්ථානය සහ ස්ථාන ටැග් කිරීම් සැකසුම් කළමනාකරණය කරන්න

ස්මාර්ට්ෆෝන් සහ කැමරා ඔබගේ ස්ථාන සැකසුම් භාවිතා කර ඡායාරූපවල geotagging (භූගෝලීය පාර-දත්ත එක් කිරීම) ඇතුළත් කළ හැක. මෙය ඔබේ නිවස හෝ ඔබේ දරුවන්ගේ පාසල වැනි ඔබේ පුද්ගලික තොරතුරු සොයා ගැනීමට භාවිතා කළ හැකි ය. geotagging (භූගෝලීය පාර-දත්ත එක් කිරීම)හෝ ස්ථාන සැකසීම් අක්‍රිය කිරීම උපාංගය අනුව වෙනස් වේ, එබැවින් නිශ්චිත උපදෙස් සඳහා ඔබේ උපාංගයේ නම භාවිතා කර මාර්ගගතව සොයන්න.